රුහුණ විශ්වවිද්‍යාලය

ව්‍යාපාර කළමනාකරණපති උපාධි පාඨමාලාව

දෙවන සමාසික අවසාන පරීක්ෂණය - අගෝස්තු 2020

# MBM 12103 - තොරතුරු කළමනාකරණ හා සන්නිවේදන පද්ධති

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

කාලය : පැය 03 යි.

---

01. (a) ඩිජිටල් ආර්ථිකයක් සංලක්ෂිත වන්නේ පොදුවේ තොරතුරු තාක්ෂණය සහ විශේෂයෙන් අන්තර්ජාලය පුළුල් ලෙස භාවිතා කිරීම මගිනි. තොරතුරු තාක්ෂණය උපාය මාර්ගික අවියක්ද? නැතිනම් පැවැත්ම සඳහා යොදාගන්නා මෙවලමක් ද ? සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(b) අන්තර්ජාලය, නව ව්‍යාපාර ආකෘති නිර්මාණය කරන්නා යැයි හඳුන්වන්නේ ඇයි?

(ලකුණු 05)
(මුළු ලකුණු 12)

02. (a) ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය, ආයතන, පාරිභෝගිකයින් සහ සමාජයට බොහෝ ප්‍රතිලාභ ලබා දෙන නමුත් එයට සීමාවන් ද ඇත. සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(b) අන්තර්ජාලය (Internet), අන්තඃජාලය (Intranet) සහ බාහිර ජාලය (Extranet) යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 12)

03. (a) මෙහෙයුම් (operational), උපායශීලී (tactical), සහ උපායමාර්ගික (strategic) ලෙස කළමනාකරණ ක්‍රියාකාරකම් සහ තීරණ වර්ග කළ හැකිය. මෙම විවිධ මට්ටම්වල ඇති තොරතුරු පද්ධති මොනවාද? මෙම ආයතනික ධූරාවලි ව්‍යුහයන්ට අනුකූලව තොරතුරු පද්ධති ගොඩනැගීමේ තර්කනය සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(b) තීරණ සහාය පද්ධතියෙහි කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 12)

04. (a) පද්ධති සංවර්ධන ක්‍රියාවලිය (Systems Development Process) පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(b) සංවිධානයක් සඳහා නව පද්ධතියක් සාර්ථකව ස්ථාපනය කිරීමේදී තීරණාත්මකව බලපාන සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 12)

05. (a) වර්තමාන ව්‍යාපාරික ලෝකයේ, දත්ත සුරක්ෂිතතාවය හුදෙක් තාක්ෂණික ගැටලුවක් ලෙස පමණක් සැලකිය නොහැකිය, එය ව්‍යාපාරික ගැටලුවකි. සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(b) ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය (Business Process Reengineering) කිරීමේ ව්‍යාපෘතිවල විවිධ ස්තල වලදී ශ්‍රී ලංකාවේ සංවිධාන මුහුණ දී ඇති ගැටළු හඳුනාගෙන මෙම ගැටළු විසඳීම සඳහා යොදාගත හැකි උපාය මාර්ග වර්ගීකරණය කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 12)

@@@@@@@